**ගම්පහ ප්‍රාදේශීය සභාව - 2022**

**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1. තත්ත්වාගණනය කළ මතය

ගම්පහ ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ගම්පහ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4. විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව  විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන  ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව  විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන්  අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හෙනරත්ගොඩ උප කාර්යාලයේ ලැබිය යුතු වරිපනම් ශේෂය, මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.30,155,042 ක් සහ කාල විශ්ලේෂණය අනුව රු.26,537,946 ක් වූයෙන් රු.3,617,096 ක වෙනසක් විය. | මෘදුකාංග දෝෂ නිවැරදි කළ පසු නිවැරදි කාලවිශ්ලේෂණ වාර්තා ලබාදීමට කටයුතු කරන බව. | වෙනස් කම් හඳුනාගෙන නිවැරදි කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1946 අංක 30 දරන බදු හා තක්සේරුකරන ආඥා පනතේ වගන්ති අංක 20 | 2002 වර්ෂයට පසු වරිපනම් තක්සේරු කර නොතිබුණි. | හෙනරත්ගොඩ බලප්‍රදේශයේ නව තක්සේරුව ක්‍රියාත්මක කරනු ඇති අතර ගලහිටියාව බලප්‍රදේශයේ තක්සේරු කටයුතු ආරම්භ කර නොමැති බව. | වරිපනම් තක්සේරුව කඩිනමින් කරවා ගත යුතුය. |
| (ආ) | අංක 2155/8 හා 2019 දෙසැම්බර් 24 දින අති විශේෂ ගැසට් පත්‍රය මගින් පනවා ඇති බස්නාහිර පළාත් ප්‍රාදේශීය සභා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ නියෝග | | | |
| (i) | අංක 83(ii) | ප්‍රාදේශීය සභා නිලධාරීන් හා සේවකයන් සඳහා වෙනම සේවක ණය අත්තිකාරම් ගිණුමක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | චක්‍රලේඛයක් මගින් හෝ දැනුවත් කර නොතිබුණු බැවින් එවැනි ගිණුමක් මෙතෙක් පවත්වාගෙන යාමට කටයුතු නොකරන ලද බව. | සේවක ණය සඳහා වෙනම අත්තිකාරම් ගිණුමක් පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | අංක 90 | මුද්දර ගාස්තු හා උසාවි දඩ ආදායම් මුදල් පදනම මත ගිණුම් ගතකර තිබුණි. | ලේඛනගත සාවද්‍ය හිඟයක් පෙන්නුම් කරන බැවින් උපචිත පදනම මත ගිණුම් තැබීම සිදු නොකරන ලද බව. | මුද්දර ගාස්තු සහ උසාවි දඩ උපචිත පදනම මත ගිණුම් තැබිය යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| | 571 (1) හා (2) | රු.27,476,264 ක් වටිනා වසර 2 ඉක්මවූ තැන්පතු 2023 මැයි 31 දින වන විටත් නියාදනය කිරීමට කටයුතුකර නොතිබුණි. | රඳවා ගත යුතු තැන්පත් රඳවාගෙන ටෙන්ඩර් තැන්පත් ආපසු ගෙවීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කරමින් පවතින බව. | වසර 2 ඉක්මවූ තැන්පතු නියාදනය කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

2.1 ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.8,036,241 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.13,806,233 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම් වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 20,211,200 | 24,576,548 | 20,537,105 | 42,978,575 | 31,661,200 | 20,893,840 | 20,803,104 | 38,939,132 |
| (ii) | කුලී | 8,303,400 | 7,578,365 | 7,734,024 | 2,700,683 | 8,986,000 | 6,672,872 | 6,535,556 | 2,998,138 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,520,000 | 1,102,512 | 1,226,012 | 64,500 | 800,000 | 780,160 | 780,106 | - |
| (iv) | වෙනත් ආදායම් | 14,211,838 | 16,515,843 | 16,515,843 | - | 109,725,000 | 79,472,392 | 79,472,392 | - |
| | | 44,246,438 | 49,773,268 | 46,012,984 | 45,743,758 | 151,172,200 | 107,819,264 | 107,591,158 | 41,937,270 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ බිල් කළ වරිපනම් ආදායම රු.24,576,548 ක් හා රැස්කරගත් | රැස්කළ සමස්ථ ආදායම රු.20,537,105 ක් වන අතර | පනත අනුව හිඟහිටි වරිපනම් බදු අය කළ |

| | | | |
|---|---|---|---|
| | ආදායම රු.15,717,367 ක් විය. | ප්‍රතිශතයක් වශයෙන් 83.56% ක් බව. | යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට හිඟ වරිපනම් වටිනාකම රු.38,939,132 ක් වූ අතර රැස් කළ වටිනාකම රු.4,819,738 ක් විය. | දේපල තහනම් කිරීමේ නිලධාරීන් නොමැති අතර ඉකුත් වර්ෂයේ පැවති ආර්ථික අර්බුදකාරී තත්වයන් මත ආදායම් පහත මට්ටමක පැවතුණ බව. | -එම- |
| (ඇ) | හෙනරත්ගොඩ උප කාර්යාලයට අදාලව 2023 ජූනි 19 දින වන විට හිඟ හිටි ශේෂය කඩ කාමර 29 කට අදාලව රු.1,023,409 ක් තිබුණි. | ඒ පිළිබඳව කමිටුවේ විමර්ශණ වාර්තාව පළාත්පාලන සහකාර කොමසාරිස් වෙත යොමුකර ඇති බව. | හිඟහිටි කඩ කුලී අය කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාළ මහජන පැමිණිලි 157 ක් විසඳා නොතිබුණි. | විවිධ ගැටළු හේතුවෙන්, නොවිසඳීමේ ප්‍රවනතාවයක් පෙන්වන බව. | මහජන පැමිණිලි විසදිය යුතුය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 මැයි 09 දින රට තුල ඇති වූ කලහකාරී තත්ත්වය තුළ අනතුරට ලක් වූ සභාවේ කැබ් රථය තක්සේරු දෙපාර්තමේන්තුවෙන් රු.9,000,000 කට තක්සේරුකර රක්ෂණ ලියකියවිලි සමාගම වෙත භාරදී ඇතත් 2023 ජූනි 19 දින වන විටත් හානිය පූරණය කර නොතිබුණි. | හානි පූර්ණය සම්බන්ධයෙන් අනෙකුත් ආයතන වලින් සිදු වූ ප්‍රමාදය හැර සභාවේ ප්‍රමාදයක් සිදු වී නොමැති බව. | හානිය පූරණය කරගත යුතුය. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට ප්‍රාග්ධන ආධාර ණය ගැති කාල විශ්ලේෂණ වාර්තාව අනුව වටිනාකම රු.21,096,489 ක් විය. | මේ පිළිබඳව අදාළ අයතන ලිඛිතව දැනුවත් කර ඇති බව. | ණය ගැති ශේෂ නිරවුල් කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට ණය හිමි ශේෂ 842 කට අදාලව ශේෂය, රු.200,087,928 ක් වී තිබුණි. | 2023 ජූනි 15 දින වන විට ණය හිමි ශේෂය රු.94,779,056 ක් බව. | ණය හිමි ශේෂ නිරවුල් කළ යුතුය. |

3.4 **වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වටිනාකම රු.700,275,000 ක් වූ ඉඩම් හා අනෙකුත් දේපල 127 ක හිමිකම් ඔප්පු හෝ අයිතිය තහවුරු කිරීම සඳහා වෙනත් නීත්‍යානුකූල ලියවිල්ලක් නොතිබුණි. | වාර්ෂික අයවැය ප්‍රතිපාදන සීමාවන්ට අනුව සිදුකරන බව. | ඉඩම්වල අයිතිය තහවුරු කිරීම සඳහා කටයුතු සිදු කළ යුතුය. |

**3.5** **මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සේවකයින්ගෙන් ලැබිය යුතු ශේෂය විශ්‍රාම ගිය එක් සේවකයෙකුගෙන් රු.86,030 ක් සහ සේවය හැර ගිය සේවකයන් පස් දෙනෙකුගෙන් රු.86,100 ක් අයවීම් සමාලෝචිත වර්ෂය අවසන් වන විට හිඟහිටව තිබුණි. | පාරිතෝෂිකයෙන් අයකිරීමටත්, අයකර ගැනීම සඳහා දන්වා යැවීමටත්, ගම්පහ සහකාර පළාත් පාලන කොමසාරිස් වෙත සාධාරනීකරණ වාර්තාව යැවීමටත්, කටයුතු කර ඇති බව. | හිඟ ණය ශේෂ අය කළ යුතුය. |